දුරකථන ) 0112669192, 0112675011
தொலைபேசி ) 0112698507, 0112694033
Telephone ) 0112675449, 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
Website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) NA/06/Annual/01/2024
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය ) 2024.11/08
திகதி )
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

චක්‍රලේඛ අංක - **01 – 44 /2024**

ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

අධ්‍යක්ෂ, ජාතික රෝහල මහනුවර / ගාල්ල,

මධ්‍යම රජයට අයත් සියලුම ශික්ෂණ රෝහල්, මහ රෝහල්, මූලික රෝහල් අධ්‍යක්ෂවරුන් ඇතුළු,

සෞඛ්‍ය ආයතන ප්‍රධානීන්

**<u>හෙද නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2024</u>**

රේඛීය අමාත්‍යාංශය යටතේ පාලනය වන සියලුම රෝහල් සහ සෞඛ්‍ය ආයතනවල සේවය කරන ස්ථානමාරු අපේක්ෂාවෙන් සිටින III, II, I සහ අධි ශ්‍රේණිවලට අයත් තනතුරුධාරී නොවන හෙද නිලධාරීන්ගෙන් 2024 වර්ෂයට අදාළව වාර්ෂික ස්ථානමාරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. **I ශ්‍රේණියේ, අධිශ්‍රේණියේ සහ විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා / අධ්‍යාපන / මහජන සෞඛ්‍ය) යන තනතුරුධාරී හෙද නිලධාරීන්හට මේ සඳහා අයදුම් කළ නොහැක.**

02. පහත සුදුසුකම් සපුරා ඇති හෙද නිලධාරීන් හට මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැකි වේ.

I. උතුරු හා නැගෙනහිර පළාත්වල මධ්‍යම රජයට අයත් රෝහල්වල සේවය කරන 2024.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ වසර 02 ක අවම සේවා කාලයක් සම්පූර්ණ කරන හෙද නිලධාරීන්ට,

II. මහරගම අපේක්ෂා රෝහල, ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය (NIMH), ජාතික බෝවන රෝග විද්‍යායතනය (IDH) සහ ස්වසන රෝග පිළිබඳ ජාතික රෝහල - වැලිසර යන ආයතනයන්හි දැනට සේවය කරන 2024.12.31 දිනට වසර 02 ක අවම සේවා කාලයක් සම්පූර්ණ කරන හෙද නිලධාරීන්ට,

III. උක්ත I සහ II හි සඳහන් නොවන අනෙකුත් සියලුම මධ්‍යම රජයට අයත් රෝහල් හා සෞඛ්‍ය ආයතනවල සේවය කරන 2024.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ වසර 04 ක අවම සේවා කාලයක් සම්පූර්ණ කරන හෙද නිලධාරීන් හට;

IV. සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (පාලන) V මගින් යුධ හමුදා රෝහල, ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සහ සීදූව විජය කුමාරතුංග අනුස්මරණ රෝහල , ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල රෝහල වෙත, අනුයුක්ත කර සිටින 2024.12.31 දිනට අදාළ රෝහල්වල සේවා කාලය වසර 02 ක් සම්පූර්ණ කරන ලද හෙද නිලධාරීන්ට (එම රෝහල්වල 2024.12.31 දිනට වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කළ හෙද නිලධාරීන් අනිවාර්යයෙන් ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, **නැතහොත් ඔවුන් සෞඛ්‍ය ලේකම් විසින් නියම කරනු ලබන ඕනෑම රෝහලක් වෙත අනිවාර්යයෙන් අනුයුක්ත කිරීමට කටයුතු කරනු ලැබේ**).

V. 2022 වාර්ෂික ස්ථානමාරු නියෝග ලබා අනුප්‍රාප්තික නිලධාරියෙකු ලද මෙතෙක් ස්ථානමාරුව ලද ස්ථානයේ සේවයට වාර්තා කර නොමැති නමුත්, එම ස්ථානමාරු ක්‍රියාත්මක වන දිනය කල් දැමීම සඳහා අනුමැතිය ලද ස්ථානමාරු නියෝග ඇති සහ ප්‍රසූත නිවාඩු ලැබීම හේතුවෙන් ස්ථානමාරු ක්‍රියාත්මක නොවූ නිලධාරීන්ගේ ස්ථානමාරු නියෝග, තවදුරටත් ඒ අයුරින්ම වලංගු වන අතර, **ඔවුන් විසින් නැවත ස්ථානමාරු සඳහා අයදුම් කළ යුතු නොවේ**. එසේ අයදුම් කරන නිලධාරීන්ගේ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව ද අවධාරණය කරමි. අනෙකුත් සියලුම වාර්ෂික ස්ථාන මාරු නියෝග මෙයින් අවලංගු වේ.

VI. 2022 වාර්ෂික ස්ථානමාරු ලබා දීමේ දී උතුරු / නැගෙනහිර සේවය කරන නිලධාරීන් තමා ස්ථානමාරු යාමට ඉල්ලා සිටින ලද රෝහල වෙත ස්ථාන මාරු නොලැබ වෙනත් අභියාචනා කැඳවීමේ දී මධ්‍යම රජයේ රෝහලකට සේවා අවශ්‍යතාවය මත ස්ථානමාරු ලැබීමට කැමැත්ත ප්‍රකාශ කළ නිලධාරීන්ට ඔවුන්ගේ උතුර / නැගෙනහිර සේවා කාලය ද වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය ද යන දෙකම එක්ව සලකා කටයුතු කර මෙවර වාර්ෂික ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

03. අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ දක්වා ඇති http://www.health.gov.lk මගින් මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ අයදුම්පත් සම්පූර්ණ කිරීම මගිනි.

**අයදුම් කරන්නන් සඳහා උපදෙස්**

I. යදුම්කරුවන් අනිවාර්යයෙන් ම සෞඛ්‍ය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ දක්වා ඇති **http://previousmoh.health.gov.lk//NOIMS 2024/index.php** යන සම්බන්ධතාවය (link) මගින් හෝ මෙහි සඳහන් **QR** කේතය භාවිතා කරමින් හෙද නිලධාරීන් සඳහා ආරම්භ කර ඇති තොරතුරු පද්ධතියේ ලියාපදිංචි විය යුතු වේ. ඒ සඳහා අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කළ යුතු ය. එම ලියාපදිංචියේ දී ඔබ වෙත ලැබෙන නාමය (User Name) සහ මුරපදය (Pass Word) සුරැකිව තබා ගැනීමට කටයුතු කළ යුතු ය.

II. එක් නිලධාරියෙකු විසින් එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කිරීමට තරයේ වග බලා ගත යුතු ය. අයදුම්පත් කිහිපයක් ඉදිරිපත් කරන නිලධාරීන්ගේ අයදුම්පත් හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරනු ලැබේ.

III. 2024 නොවැම්බර් 20 දින මාර්ගගත ක්‍රමය මගින් අයදුම්පත් යොමු කිරීමට ලබා දී ඇති අවසන් දිනය වන අතර, ඉන් පසු ඒ සඳහා කිසිදු අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

IV. යම් නිලධාරියෙකුට අයදුම්පතේ සඳහන් තොරතුරුවල වෙනස්කම් කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා 2024.11.22 දින දක්වා අවස්ථාව ලැබේ. එබඳු අවස්ථාවල දී අවසන්වරට නිවැරදි කරන ලද අයදුම්පතෙහි මුද්‍රිත පිටපත රෝහලේ පෞද්ගලික ලිපිගොනුව විෂය භාර නිලධාරියා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

V. මාර්ගගත අයදුම්පත මගින් ඉල්ලා ඇති සියලු ම තොරතුරු අයදුම්කරු විසින් සම්පූර්ණ කර ඉදිරිපත් (submit) කළ යුතු අතර, ඉන් අනතුරුව අයදුම්කරු වෙත ලැබෙන අයදුම්පතේ PDF මෘදු පිටපත (Soft copy) පරිගණක මුද්‍රණ යන්ත්‍රයක් ආධාරයෙන් මුද්‍රණය කර, අයදුම්කරුගේ අත්සන හා දිනය සටහන් කිරීමෙන් පසු, සේවය කරන රෝහලේ ප්‍රධාන විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී / නිලධාරිනිය මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව, අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුව විෂය භාර නිලධාරියා වෙත භාර දීමට කටයුතු කළ යුතු වේ.

VI. අදාළ විෂය ලිපිකරු විසින් අයදුම්කරුගේ අයදුම්පතේ සඳහන් කර ඇති සියලුම තොරතුරු ඔහුගේ හෝ ඇයගේ පෞද්ගලික ලිපිගොනුවට අනුව නිවැරදි බවට තහවුරු කර, රෝහල් ලේකම් / පරිපාලන නිලධාරී මගින් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

VII. ආයතන ප්‍රධානියා විසින් නිර්දේශ කර, නිල මුද්‍රා තබන ලද අයදුම්පත් මෙම චක්‍රලේඛයේ ඇමුණුම 02 ලෙස දක්වා ඇති උප ලේඛනය අනුව සම්පූර්ණ කර, ආවරණ ලිපියක් ද සමඟ පහත ලිපිනය වෙත අතින් ගෙනවිත් භාර දීමට කටයුතු කළ යුතු වේ.

**අධ්‍යක්ෂ (පාලන) I,**
**සෞඛ්‍ය අමාත්‍යාංශය,**
**සුවසිරිපාය,**
**කොළඹ 10.**

VIII. වැඩිදුරටත් යම් පැහැදිලි කිරීමක් අවශ්‍යවන්නේ නම් දුරකථන අංක හෝ 011-2674967 011-2693753 මගින් විමසිය හැකි වේ.

04. **අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීමට ලබා දී ඇති කාලය 2024.11.22 දිනෙන් අවසන් වේ. ආයතන ප්‍රධානී විසින් නිර්දේශ කළ අයදුම්පත්, අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනය වන 2024.11.29 දිනට ප්‍රථම මෙම අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (පාලන) I ශාඛාව වෙත ලැබීමට සැලැස්වීම ආයතන ප්‍රධානියාගේ වගකීමක් වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

05. අයදුම්පත් යොමු කිරීමේ දී සැලකිය යුතු විශේෂ කරුණු

I. **මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් යොමු කළ ද, එහි මුද්‍රිත පිටපතක් අනිවාර්යයෙන් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ද සහිතව ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොකරන ලද අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

II. සෑම අයදුම්කරුවෙක්ම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතු අතර, සෑම නිලධාරියකු පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු ඉදිරිපත් කරනු ලබන බවට සෑම ආයතන ප්‍රධානියෙක් විසින්ම වගබලා ගත යුතු ය.

III. මෙම නිවේදනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සිය ආයතනයේ ප්‍රසූත නිවාඩු, විශේෂ නිවාඩු, තාවකාලික ස්ථානමාරු ආදිය ලැබ සිටින හෙද නිලධාරීන් ද ඇතුළුව අදාළ සෑම නිලධාරියෙකුටම දැන ගැනීමට සැලැස්විය යුතු ය. සාවද්‍ය තොරතුරු සැපයීමෙන් හෝ සුදුසුකම්ලත් නිලධාරීන්ට අයදුම්කිරීමට අවස්ථාව නොලැබීමෙන් හෝ ඇතිවන අපහසුතාවන් පිළිබඳව මෙම අමාත්‍යාංශය වග නොකියන අතර, ඒ සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානීන් වගකීමට බැඳෙන බව කාරුණිකව දන්වමි.

IV. මෙම චක්‍රලේඛයට අනුව ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කරන සියලුම දෙනාට ස්ථානමාරු ලබා දෙන බවක් මෙහි සඳහන් වගන්ති කිසිවකින් අදහස් නොකරන අතර, එසේ තේරුම් ගත යුතු ද නොවේ.

V. ස්ථානමාරු සලකා බලනු ලබන අවස්ථාවේ දී පවතින රෝහල්හි පුරප්පාඩු ලේඛන ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කරන අතර, එසේ පුරප්පාඩු නොමැති රෝහල්වලට කරන ලද ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

VI. පළාත් සභා යටතේ පාලනය වන රෝහල් සහ සෞඛ්‍ය ආයතන සඳහා ස්ථිරව මුදාහැරීමට ඉල්ලුම් කර, සුදුසුකම් සපුරාලන නිලධාරීන් සඳහා අදාළ පළාතේ පුරප්පාඩු පවතී නම් පළාත් එකඟතාව ලබා ගැනීමට යටත්ව ස්ථානමාරු නියෝග නිකුත් කරනු ලැබේ. එසේ වුව ද අදාළ පළාත් එකඟතාවන් ලබා ගැනීමෙන් අනතුරුව ඔවුන් පළාත වෙත මුදාහරින ලෙස ආයතන ප්‍රධානීන් වෙත දැනුම් දෙන තුරු ඔවුන් මුදාහැරීම නොකළ යුතු බව අවධාරණය කරමි.

06. වාර්ෂික ස්ථානමාරු කාලසටහන

| අංක | කාර්යය | දිනය |
|---|---|---|
| 01. | වාර්ෂික ස්ථානමාරු කමිටු පිහිටුවීම | ඔක්තොම්බර් 01 |
| 02. | අයදුම්පත් කැඳවීම සඳහා වෙබ් අඩවියේ පළ කිරීම | නොවැම්බර් 09 |
| 03. | මාර්ගගත (online) ක්‍රමය මගින් අයදුම්පත් සම්පූර්ණ කර ඉදිරිපත් (submit) කිරීම | නොවැම්බර් 22 |
| 04. | මාර්ගගත (online) ක්‍රමය මගින් ඉදිරිපත් කළ අයදුම්පත්වල මුද්‍රිත පිටපත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම | නොවැම්බර් 29 |
| 05. | වාර්ෂික ස්ථානමාරු ඉල්ලීම් ඇතුළත් කර ලැයිස්තු සකස් කර අවසන් කිරීම | දෙසැම්බර් 16 |
| 06. | වාර්ෂික ස්ථානමාරු කමිටු රැස්කිරීම සහ ස්ථානමාරු නිර්දේශ ලබා ගැනීම | දෙසැම්බර් 18 |
| 07. | වාර්ෂික ස්ථානමාරු නිර්දේශ අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පළ කිරීම සහ අභියාචනා කැඳවීම | දෙසැම්බර් 23 |
| 08. | මාර්ගගත (online) ක්‍රමය මගින් අභියාචනා අයදුම්පත් සම්පූර්ණ කර ඉදිරිපත් (submit) කිරීම | දෙසැම්බර් 31 |
| 09. | මාර්ගගත (online) ක්‍රමය මගින් ඉදිරිපත් කළ අභියාචනාවල මුද්‍රිත පිටපත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම | ජනවාරි 10 |
| 10. | අභියාචනා ඉල්ලීම් ද ඇතුළත් කර නැවත ස්ථානමාරු ලැයිස්තු සකස් කර අවසන් කිරීම | ජනවාරි 20 |
| 11. | අභියාචනා මණ්ඩලය රැස්කර අභියාචනා සඳහා නිර්දේශ ලබා ගැනීම | ජනවාරි 24 |
| 12. | වාර්ෂික ස්ථානමාරු ලේඛනය ප්‍රසිද්ධ කිරීම | ජනවාරි 31 |
| 13. | වාර්ෂික ස්ථානමාරු සඳහා අවසන් ස්ථානමාරු නියෝග නිකුත් කිරීම | 2019 හෙද කණ්ඩායමට පත්වීම් ලබා දීමට සමගාමීව |

07. ලැබෙන සියලුම ස්ථානමාරු ඉල්ලීම් ඇතුළත් කර, ඉල්ලුම්කරු **වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය අනුව ජ්‍යෙෂ්ඨතා ලේඛනයක් සකස්** කරන අතර, එකම දින සේවයට වාර්තා කළ නිලධාරීන් සඳහා **සිසු හෙද පුහුණුවේ අවසන් පරීක්ෂණයේ දී ලබාගත් දිවයිනේ කුසලතාවයට අනුව, ජ්‍යෙෂ්ඨතාවය තීරණය කරනු ලැබේ.** එම ලේඛනය ස්ථානමාරු මණ්ඩලයක් වෙත යොමු කර, එම මණ්ඩලයේ නිර්දේශ අනුව 2024.12.31 දිනට 02 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරාලන හෙද නිලධාරීන් සඳහා ස්ථානමාරු නියෝග නිකුත් කරනු ලැබේ. එම නියෝග www.health.gov.lk අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පළ කර අභියාචනා කැඳවන අතර, අභියාචනා මණ්ඩලයේ නිර්දේශ ද සලකා බලා සකස් කරනු ලබන ස්ථානමාරු නියෝග සහිත අවසන් ලේඛනය නැවත www.health.gov.lk යන සෞඛ්‍ය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. එසේම ස්ථානමාරු සම්බන්ධව විමසීම් කිරීම සඳහා වරින් වර මෙම අමාත්‍යාංශය වෙත පැමිණීම අනවශ්‍ය බවට නිලධාරීන් දැනුවත් කිරීම මැනවි.

08. 2024 වාර්ෂික ස්ථානමාරු ක්‍රියාවලිය සිදුවෙන කාල වකවානුවේ දී තාවකාලික ස්ථානමාරු සහ වෛද්‍ය හේතු මත ක්‍රියාත්මක වන ස්ථානමාරු හැර අනෙකුත් සියලුම ස්ථානමාරු අත්හිටුවන බව ද නිලධාරීන් දැනුවත් කිරීම මැනවි.

09. 2024 වර්ෂය සඳහා ස්ථානමාරු නියෝග ලද හෙද නිලධාරීන් සඳහා අනුප්‍රාප්තිකයින් 2019 සිසු හෙද කණ්ඩායම මගින් ලබාදීමට නියමිත අතර, අනුප්‍රාප්තිකයින් පිළිබඳ විස්තර ද ඇතුළත්ව ස්ථානමාරු ලබන නිලධාරීන් පිළිබඳව ලිඛිතව ආයතන ප්‍රධානීන් දැනුවත් කරනු ලැබේ.

10. රෝගී සත්කාරක සේවාව යාවත්කාලීනව පවත්වා ගෙන යාම හෙද සේවාවේ මූලික අරමුණ බැවින් ස්ථානමාරු නියෝග ලැබුව ද අනුප්‍රාප්තිකයන් රහිතව, රෝහල් සේවාව අඩාලවන අයුරින් නිලධාරීන් මුදා හැරීමට කටයුතු නොකරන බව අවධාරණය කරමි.

11. **ස්ථානමාරු මණ්ඩලයේ නිර්දේශ හෝ වාර්ෂික ස්ථානමාරු නියෝග කිසිවෙකුටත් පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.**

12. මෙහි සඳහන් නොවන ස්ථානමාරු සම්බන්ධයෙන් බලපානු ලබන වෙනත් කරුණු සම්බන්ධයෙන් **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සහ ආයතන සංග්‍රහය ප්‍රකාරව අවසන් තීරණය ගැනීමේ බලය සෞඛ්‍ය ලේකම් සතු වේ.** මෙම චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අතර අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල පාඨය බලපැවැත්වේ.

වෛද්‍ය පී. ජී. මහීපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**වෛද්‍ය පී.ජී. මහීපාල,**
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

01. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - දැ.ගැ.පි
02. හෙද වෘත්තීය සමිති - දැ.ගැ.පි

## Cadre Details - III,II,I & Supra Nursing Officers

Anex - 01

| NO | Institution | Approved Cadre | Available Staff | Vacancies |
|---|---|---|---|---|
| 1 | Teaching Hospital Jaffna | 732 | 641 | 91 |
| 2 | General Hospital - Ampara | 500 | 458 | 42 |
| 3 | Ashroff Memorial Hospital - Kalmunai | 211 | 210 | 1 |
| 4 | Base Hospital - Kalmunai (North) | 215 | 209 | 6 |
| 5 | Base Hospital Akkaraipattu | 154 | 148 | 6 |
| 6 | Teaching Hospital - Batticaloa | 675 | 611 | 64 |
| 7 | Base Hospital Pothuvil | 48 | 48 | 0 |
| 8 | Base Hospital Kanthale | 138 | 138 | 0 |
| 9 | District General Hospital Trincomalee | 300 | 250 | 50 |
| 10 | National Hospital -Galle | 1821 | 1735 | 86 |
| 11 | German - Srilanka Friendship Hospital For women Karapitiya - Galle | 310 | 297 | 13 |
| 12 | District General Hospital - Matara | 1354 | 1066 | 288 |
| 13 | District General Hospital - Hambanthota | 600 | 537 | 63 |
| 14 | Teaching Hospital - Anuradhapura | 1319 | 1132 | 187 |
| 15 | Teaching Hospital Polonnaruwa | 600 | 569 | 31 |
| 16 | National Nephrology Specialized Hospital - Polonnaruwa | 100 | 84 | 16 |
| 17 | Teaching Hospital - Kurunegala | 1459 | 1388 | 71 |
| 18 | Teaching Hospital - Kuliyapitiya | 317 | 310 | 7 |
| 19 | District General Hospital - Chilaw | 320 | 294 | 26 |
| 20 | National Institute of Infectious Diseases | 194 | 179 | 15 |
| 21 | Lady Ridgeway Hospital for Children (Teaching) | 900 | 870 | 30 |
| 22 | National Institute of Mental Health | 497 | 421 | 76 |
| 23 | Castle Street Hospital for Women (Teaching) | 389 | 332 | 57 |
| 24 | National Eye Hospital Sri Lanka | 234 | 199 | 35 |
| 25 | The National Hospital of Sri Lanka | 2928 | 2647 | 281 |
| 26 | Colombo East Base Hospital - Mulleriyawa | 200 | 164 | 36 |
| 27 | Medical Research Institute - Borella | 1 | 1 | 0 |
| 28 | Family Health Bureau | 6 | 6 | 0 |
| 29 | National Dental Hospital (Teaching) Sri Lanka | 108 | 81 | 27 |
| 30 | De Soysa Hospital For Women (Teaching) | 335 | 295 | 40 |
| 31 | National Blood Transfusion Service | 643 | 609 | 34 |
| 32 | National Cancer Control Programme | 5 | 2 | 3 |
| 33 | Colombo South Teaching Hospital - Kalubowila | 1100 | 917 | 183 |
| 34 | Divisional Hospital (Type-A) - Kandana | 52 | 47 | 5 |

| NO | Institution | Approved Cadre | Available Staff | Vacancies |
|---|---|---|---|---|
| 35 | Institute of Oral Health - Maharagama | 20 | 18 | 2 |
| 36 | Leprosy Hospital - Hendala | 8 | 7 | 1 |
| 37 | Anti Filariasis Campaign | 1 | 1 | 0 |
| 38 | Apeksha Hospital - Maharagama | 630 | 620 | 10 |
| 39 | National STD/AIDS Control Programme | 14 | 10 | 4 |
| 40 | National Programme for Tuberculosis Control & Chest Diseases | 22 | 20 | 2 |
| 41 | The National Institute for Nephrology Dialysis & Transplantation - Maligawattha | 110 | 108 | 2 |
| 42 | Colombo North Teaching Hospital - Ragama | 1045 | 965 | 80 |
| 43 | Rheumatolgy & Rehabilitation Hospital, Ragama | 98 | 92 | 6 |
| 44 | National Hospital for Respiratory Diseases - Welisara, Ragama | 220 | 203 | 17 |
| 45 | District General Hospital - Negombo | 375 | 320 | 55 |
| 46 | Teaching Hospital - Kalutara | 761 | 661 | 100 |
| 47 | Government Hospital - Aluthgama | 30 | 29 | 1 |
| 48 | Base Hospital - Beruwala | 35 | 29 | 6 |
| 49 | Goverment Hospital - Darga Town | 30 | 30 | 0 |
| 50 | Teaching Hospital - Rathnapura | 884 | 835 | 49 |
| 51 | District General Hospital - Embilipitiya | 325 | 315 | 10 |
| 52 | General Hospital (Teaching) - Kegalle | 590 | 568 | 22 |
| 53 | National Hospital - Kandy | 2100 | 1956 | 144 |
| 54 | Teaching Hospital - Peradeniya | 682 | 643 | 39 |
| 55 | Sirimavo Bandaranayake Specialized Children's Hospital (Teaching) - Peradeniya | 250 | 220 | 30 |
| 56 | Base Hospital (Teaching) - Gampola | 245 | 229 | 16 |
| 57 | District General Hospital - Nawalapitiya | 300 | 264 | 36 |
| 58 | District General Hospital - NuwaraEliya | 395 | 362 | 33 |
| 59 | District General Hospital - Matale | 300 | 298 | 2 |
| 60 | Teaching Hospital - Badulla | 900 | 793 | 107 |
| 61 | District General Hospital - Monaragala | 350 | 328 | 22 |

Chamika S. Gamage
Deputy Director General (Administration) II
Ministry of Health
"Suwasiripaya"
Colombo 10.

## හෙද නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු 2024

ආයතනයේ නම - ..............................................................................

| අනු අංකය | මාර්ගගත **(online)** අයදුම්පතේ අංකය **(Index No)** | ස්ථානමාරු අපේක්ෂිත නිලධාරියාගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය | ශ්‍රේණිය | ඔබ ආයතනයේ සේවයට වාර්තාකළ දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

වාර්ෂික ස්ථානමාරු චක්‍රලේඛයට අනුව සුදුසුකම් සපුරාලන ලද ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියළුම හෙද නිලධාරීන්ගේ අයදුම්පත් මෙම උපලේඛනයට ඇතුලත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ

අත්සන - ..........................................

නම - ..........................................

දිනය - ..........................................

පරීක්ෂා කළේ

අත්සන - ..........................................

නම - ..........................................

දිනය - ..........................................

ආයතන ප්‍රධානියාගේ නිර්දේශය - : ..................................
(අත්සන හා නිලමුද්‍රාව)

දිනය : ..................................